**උසස් අධ්‍යාපනය පුළුල් කිරීම සහ සංවර්ධනය කිරීම වේගවත් කිරීමේ ව්‍යාපෘතිය - (වැඩසටහන් සංරචක) -2023**

---

උසස් අධ්‍යාපනය පුළුල් කිරීම සහ සංවර්ධනය කිරීම වේගවත් කිරීමේ ව්‍යාපෘතියේ (වැඩසටහන් සංරචකය) 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදි ජනරජය හා ප්‍රතිසංස්කරණය සහ සංවර්ධනය උදෙසා වන ජාත්‍යන්තර බැංකුව සහ ජාත්‍යන්තර සංවර්ධන සංගමය අතර 2017 ජුලි 17 දින එළඹි අංක 8743 එල්කේ දරන ණය ගිවිසුමේ හා අංක 6026 එල්කේ දරන මූල්‍ය ගිවිසුමේ 4.09(ආ) ව්‍යවස්ථා සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදි ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුවට වාර්තා කළ යුතු යැයි මා සලකන මාගේ අදහස් හා නිරීක්ෂණ මෙම වාර්තාවේ දැක්වේ.

## 1.2 ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් යෙදවීම හා ව්‍යාපෘති කාලය

ව්‍යාපෘතියේ ණය හා මූල්‍ය ගිවිසුම්වලට අනුව, එවකට උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍යාංශය වර්තමානයේ අධ්‍යාපන අමාත්‍යාංශය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවීමේ නියෝජිතායතනය වන අතර රජයේ විශ්වවිද්‍යාල සහ ශ්‍රී ලංකා උසස් තාක්ෂණික අධ්‍යාපන ආයතන, උසස් තාක්ෂණික ආයතන සහ අමාත්‍යාංශය සහ විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් අනුමත රාජ්‍ය නොවන උසස් අධ්‍යාපන ආයතන ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය වේ.

ප්‍රමුඛ විෂයයන්ට (විද්‍යාව, තාක්ෂණය, ඉංජිනේරු සහ වෛද්‍ය අංශ) රජයේ විශ්ව විද්‍යාලවලට, ශ්‍රී ලංකා උසස් තාක්ෂණික අධ්‍යාපන ආයතන, උසස් තාක්ෂණික ආයතන සහ රාජ්‍ය නොවන උසස් අධ්‍යාපන ආයතනවලට ඇතුළත්වීම වැඩිකිරීම, උපාධි වැඩසටහන්වල ගුණාත්මකබව වැඩිදියුණු කිරීම හා උසස් අධ්‍යාපන අංශයේ පර්යේෂණ හා නව සොයා ගැනීම් දිරිමත් කිරීම ව්‍යාපෘතියේ අරමුණු වේ.

ණය සහ මූල්‍ය ගිවිසුම්වලට අනුව, ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත මුළු පිරිවැය රු.මිලියන 18,136කට සමාන එජඩො මිලියන 100 මුල්‍යනය කිරීමට ජාත්‍යන්තර සංවර්ධන සංගමය එකඟ වී තිබුණි.

ව්‍යාපෘතිය එහි කටයුතු 2018 මාර්තු 01 දින ආරම්භ කරන ලද අතර 2023 ජුනි 30 වන විට නිම කිරීමට සැලසුම් කර තිබුණි.

## 1.3 මතය

ව්‍යාපෘතියේ 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය කාර්යසාධනය හා එහි මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

## 1.4 මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ල.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදුකරන ලදි. මෙම විගණන ප්‍රමිත යටතේ වූ මාගේ වගකීම,මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත.මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් හා උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.5 මූල්‍ය ප්‍රකාශන සඳහා කළමනාකාරිත්වයේ වගකීම් සහ පාලනය භාරව සිටින අයගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ව්‍යාපෘතියේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබා දීම සහ මාගේ මතය ඇතුලත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතික වීම උසස් මට්ටමේ සහතික වීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිත ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක අවප්‍රකාශයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා හා වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම් නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශයන් ඇති විය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බවට අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැක මුසු බවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදි., තවද

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගේ අවදානම් හදුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලැසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නා වූ අවදානම් මඟහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබා ගැනීම මාගේ මතයට පදනම් වේ. ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදු වන්නා වූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලැසුම් කිරීම පිණිස ව්‍යාපෘතියේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- භාවිත කරන ලද ගිණුම්කරන ප්‍රතිපත්තිවල සහ ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල යෝග්‍යතාවය අගයන ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කිරීම, ව්‍යුහය සහ අන්තර්ගතය ඇගයීමට ලක්කළ අතර, ඒ සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව අගයන ලදි.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දූර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරන ලදි.

## 2. මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 2.1 නීති, රීති සහ රෙගුලාසි වලට අනුකූල නොවීම

| නීති රීති සහ රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම/ විගණන නිරීක්ෂණය | කළමනාකරණයේ අදහස් දැක්වීම් | විගණකගේ නිර්දේශ |
|---|---|---|---|
| 2019 මාර්තු 15 දිනැති අංක 01/2019 දරන කළමනාකරණ සේවා චක්‍රලේඛය | ව්‍යාපෘති මෙහෙයුම් කමිටුව අවම වශයෙන් මාස දෙකකට වරක් රැස්විය යුතුය. කෙසේ වෙතත්, 2023 වර්ෂය තුළ එක් රැස්වීමක් පමණක් පවත්වා තිබුණි. | මෙය ව්‍යාපෘති කාර්යාලයේ පාලනයෙන් තොර වේ. එසේ වුවද, 2023 වර්ෂය තුළ ප්‍රගති සමාලෝචන රැස්වීම් වාරික වශයෙන් අමාත්‍යාංශයේදී පවත්වා තිබුණි.. | කළමනාකරණ සේවා චක්‍රලේඛයට අනුකූල විය යුතුය. |

## 3. භෞතික කාර්යයසාධනය

### 3.1 ව්‍යාපෘති පරිපාලනය

| | විගණන නිරීක්ෂණය | කළමනාකරණයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ මෙම ව්‍යාපෘතිය යටතේ ව්‍යාධි විද්‍යා අංශය සඳහා මහල් 04කින් ඉදිකිරීමට සැලසුම් කර තිබුණ ගොඩනැගිල්ල රු. මිලියන 153ක මුදලක් වැය කර මහල් 02ක් පමණක් නිමකර විශ්වවිද්‍යාලයට භාරදී තිබුණි. | මහල් හතර සඳහාම සියලුම බාහිර වැඩ සම්පූර්ණ ව්‍යුහාත්මක කටයුතු නිම කර ඇත. රෝනා වසංගතයත් සමඟ අනපේක්ෂිත මිල නයක් ඇති වූ අතර බලධාරීන් විසින් ගනු ලැබූ ය මත ඉදිකිරීම් කටයුතු පවතින අයවැය දනවලට සීමා කර මහල් දෙක භාවිතයට න පරිදි නිම කර මුලිකවම භාවිතයට ගත් බව. ීම් කටයුතු අවසන් කිරීම සඳහා නැගිල්ලේ ඉතිරි කටයුතු නිම කිරීම් කටයුතු රනු ලබන බව. | කොන්ත්‍රාත් ගිවිසුමේ දක්වා ඇති කොන්දේසිවලට අනුකූල විය යුතුය. |
| (ආ) | සබරගමුව විශ්වවිද්‍යාලයේ කළමනාකරණ අධ්‍යයන(FMS) පීඨයේ ELTA-ELSE සංවර්ධන ව්‍යාපෘතිය සඳහා වෙන් කර ඇති ප්‍රතිපාදනවලින් රු. මිලියන 15ක් වැය කරමින් 2021 සහ 2022 වර්ෂවල Idea Generating Business Incubation and Social Emotional Development Centre, Soft Furniture Reception Area and Common Gathering Area Centre සහ කඩදාසි ප්‍රතිචක්‍රීකරණ මධ්‍යස්ථානය ඉදිකරන ලද අතර ව්‍යාපෘතිය මගින් කඩදාසි ප්‍රතිචක්‍රීකරණය සඳහා රු. මිලියන 3.4ක් වැයකර මිලදී ගත් උපකරණ 2023 දෙසැම්බර් වනතුරුත් ඌන උපයෝජිතව පැවතුණි. | Idea Generating Business Incubation and Social Emotional Development Center යනු දිනපතා වැඩ කරන වේලාවන්හි ක්‍රියාත්මක වන කාර්යාල අවකාශයක් නොවන අතර එය අප ව්‍යාපෘති යෝජනාවේ සඳහන් කර තිබූ පරිදි බහුවිධ අරමුණු සඳහා පොදු අවකාශයක් ලෙස භාවිතා කරනු ලැබේ.<br><br>කඩදාසි ප්‍රතිචක්‍රීකරණ මධ්‍යස්ථානය සහ උපකරණ ක්‍රියාත්මක කිරීම සඳහා FMSහි සිසුන් විසින් ඔවුන්ගේ පැවරුම් සහ ව්‍යාපෘති සඳහා විශ්වවිද්‍යාලයේ විවිධ පීඨ/අංශවල ඉවතලන කඩදාසි භාවිතා කරනු ලැබේ. විශ්ව විද්‍යාලයේ ශ්‍රම බලකායේ හිඟය හේතුවෙන් කඩදාසි ප්‍රතිචක්‍රීකරණ මධ්‍යස්ථානයේ සේවය කිරීමට පූර්ණ කාලීන වැඩ ආධාරයක් වෙන් කිරීමට නොහැකි වන අතර එය වාණිජ මට්ටමේ ක්‍රියාකාරිත්වයට ප්‍රධාන බාධාවක් බව. | ප්‍රමාදයකින් තොරව සම්පත් ප්‍රයෝජනයට ගත යුතුය. |
| (ඇ) | 2019 අගෝස්තු සිට 2020 ජනවාරි දක්වා කාලය තුළ මිලදී ගැනීමට නියමිතව තිබූ රු. මිලියන 20 ක භාණ්ඩ හා උපකරණවල ප්‍රසම්පාදන කටයුතු වසර 01 සිට වසර 03 දක්වා ප්‍රමාද වීම හේතුවෙන් වෙළෙඳපොළ මිල ඉහළ යාම හේතුවෙන් ඇස්තමේන්තුගත පිරිවැය ඉක්මවා රු. මිලියන 18 ක් වැය කර තිබුණි. | කළමනාකාරිත්වයේ අදහස් ලබා දී නොතිබුණි. | ව්‍යාපෘති කටයුතු කඩිනමින් අවසන් කළ යුතුය. |

## 3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| අංකය | විගණන නිරීක්ෂණය | කළමනාකරණයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2018 සහ 2019 වර්ෂවල උසස් අධ්‍යාපන ව්‍යාප්තිය, හා සංවර්ධනය කඩිනම් කිරීමේ ව්‍යාපෘතිය (AHEAD) ව්‍යාපෘතිය මඟින් ආචාර්ය උපාධිය සඳහා ශිෂ්‍යත්ව ලබාගෙන විදේශගත වූ විශ්වවිද්‍යාල 06ක ආචාර්යවරුන් 20 දෙනෙකු 2023 දෙසැම්බර් 31 දින වන විට ද ආචාර්ය උපාධිය සම්පූර්ණ කර නොතිබූ බව විගණනයේදී නිරීක්ෂණය විය. | ආචාර්ය උපාධි ශිෂ්‍යත්ව වැඩසටහන සම්බන්ධයෙන් සිදු කරන ලද විගණන නිරීක්ෂණවලදී මතු වූ ගැටළු පිළිබඳව මෙහෙයුම් අධීක්ෂණ සහ සහාය කණ්ඩායම(OMST) විසින් අදාළ විශ්වවිද්‍යාලවල උපකුලපතිවරුන් විසින් විශේෂ අවධානය යොමු කරනු ලබන බව. බැඳුම්කර ගිවිසුමේ කොන්දේසි ක්‍රියාත්මක කිරීම විශ්වවිද්‍යාලවල වගකීමක් වන බව. | ආචාර්ය උපාධිය සම්පූර්ණ නොකළ ආචාර්යවරුන්ට එරෙහිව පියවර ගත යුතුය. |
| (ආ) | දැනට භාවිතා කරන ගෘහස්ථ කොම්පෝස්ට් බඳුන මහා පරිමාණ නිෂ්පාදන ආකෘතියක් ලෙස සහ ඉහළ වාණිජ නිෂ්පාදනයක් ලෙස වෙළඳපොළට හඳුන්වා දීම අරමුණු කරගත් පර්යේෂණ ව්‍යාපෘතියක් සඳහා උසස් අධ්‍යාපන ව්‍යාප්තිය, හා සංවර්ධනය කඩිනම් කිරීමේ ව්‍යාපෘතිය(AHEAD) ලෝක බැංකු ණය ආධාර යටතේ රුපියල් මිලියන 50 ක් වැය කර තිබුණි. ගුණාත්මක සත්ව ආහාර සහ කාබනික පොහොර. නිෂ්පාදනය කර ඇති මහා පරිමාණ කොම්පෝස්ට් බඳුන සඳහා ශ්‍රී ලංකා ජාතික බුද්ධිමය දේපළ කාර්යාලය මගින් දන්වා තිබූ නිර්ණායක සම්පූර්ණ කිරීමට කටයුතු කර නොතිබීම නිසා එම ඒකකය සමඟ එක්ව ක්‍රියාත්මක වන අස්වනු නෙලීමේ ඒකකය වාණිජකරණය කිරීමට නොහැකි වී තිබුණි.එම කීටයන් විසින් සකස් කරන ලද ආහාර සහ එම ආහාර සැකසීමේ තාක්ෂණික ක්‍රමය සඳහා පේටන්ට් බලපත්‍රයක් ඉල්ලුම් කර තිබුණද තාක්ෂණික ක්‍රමවේදයේ දුර්වලතා හේතුවෙන් එම ඉල්ලුම්පත්‍රයද ප්‍රතික්ෂේප වී තිබුණි. අදාළ නිර්ණායක සම්පූර්ණ කර නොතිබීම සහ අපේක්ෂිත ප්‍රතිඵල ලබා ගැනීමට කටයුතු නොකිරීම හේතුවෙන් දරන ලද වියදම් නිෂ්ක්‍රිය වී තිබුණි. | කොවිඩ් වසංගතය හේතුවෙන් සමස්ත ව්‍යාපෘති කාලරාමුව විශාල වශයෙන් කඩාකප්පල් විය. කුඩා කොම්පෝස්ට් ගොඩවල් අප බලාපොරොත්තු වූ පරිදි ජනප්‍රිය නොවීය. එය වසංගතය සහ සංචලන සීමා කිරීම්, නිවෙස්වලට යාම නිසා ඇති විය. එමනිසා, කුඩා බඳුන සාර්ථක ලෙස පරීක්ෂා කිරීමට නොහැකි විය. කුඩා බඳුනක් සෑදීමට භාවිතා කරන මූලික පේටන්ට් බලපත්‍රවල ප්‍රධාන දෝෂ පැවතුණි. එය එළිමහන් පරිසරය තුළ මිත්‍රශීලී ලෙස නිර්මාණය කර නොතිබුණි. පේටන්ට් බලපත්‍ර අනුමත කිරීමේ නියෝජිතායතනය ලෙස ශ්‍රී ලංකාවේ බුද්ධිමය දේපල කාර්යාලය සලකා බලා නොතිබුණි. ඒ නිසා මේ පරීක්ෂණ පැවැත්වූ පරිසරයේ අධික වර්ෂාව, ආර්ද්‍රතාවය සහ රාත්‍රී කාලයේ උෂ්ණත්ව තත්ත්වයන් මෙම ක්ෂුද්‍රජීවී ක්‍රියාකාරිත්වයේ සහ දුගඳෙහි වෙනස් වීමට හේතු විය හැකි බව අපි සිතමු. | අවසාන ප්‍රතිඵලය සාක්ෂාත් කර ගැනීම සඳහා උපරිම උත්සාහයක් ගත යුතුය. |

**3.3 ව්‍යාපෘතියේ කටයුතු ආරම්භ කිරීම / ක්‍රියාත්මක කිරීම / අවසන් කිරීම ප්‍රමාද වීම**

| විගණන නිරීක්ෂණය | කළමනාකරණයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශය |
| --- | --- | --- |
| යාපනය විශ්ව විද්‍යාලය සඳහා ඉංජිනේරු තාක්‍ෂණය සහ පද්ධති තාක්‍ෂණය සඳහා ගොඩනැගිල්ලක් ඉදිකිරීම සඳහා වටිනාකම රු. මිලියන 432 කට 2021 දෙසැම්බර් 15 වන දින මෙම ව්‍යාපෘතිය මගින් කොන්ත්‍රාත්තුව ප්‍රදානය කරන ලදී. ගිවිසුමට අනුව, 2023 ජුනි මාසයේදී ඉදිකිරීම් අවසන් කළ යුතු වුවද 2023 දෙසැම්බර් 31 දක්වා දින දීර්ඝ කරන ලදී. කෙසේ වෙතත්, ඉදිකිරීම් කටයුතුවලින් සියයට 36 ක් පමණක් 2023 දෙසැම්බර් 31 දක්වා අවසන් කර ඇති බව නිරීක්ෂණය විය. | යාපනය විශ්ව විද්‍යාලය විසින් මෙම අදියර II 2023 ජුනි මාසය වන විට අවසන් කිරීමට අපේක්ෂා කළ අතර, මෙම බලාපොරොත්තුව ඇතිව, තාක්ෂණ පීඨයට සිසුන් බඳවා ගැනීම ඉහළ නැංවීමේ රජයේ ප්‍රතිපත්තියට පහසුවෙන් අනුකූල වීමට හැකි විය. දැනට සෑම අධ්‍යයන වර්ෂයකදීම සිසුන් 400ක් පමණ ඇතුළත් කර ගනු ලැබේ. ශිෂ්‍ය ප්‍රමාණය වැඩිවීමට සරිලන පරිදි දැනට පවතින ගොඩනැගිලි පහසුකම් ප්‍රමාණවත් නොවන බව. මෙය අධ්‍යයන වැඩසටහනේ ගුණාත්මක භාවයට බලපාන අතර ශිෂ්‍ය නොසන්සුන්තාවයට හේතු විය හැක. උසස් අධ්‍යාපන ව්‍යාප්තිය, හා සංවර්ධනය කඩිනම් කිරීමේ ව්‍යාපෘතිය (AHEAD) ව්‍යාපෘතියේ ඉතිරි මුදල් අධ්‍යාපන අමාත්‍යාංශය වෙත වෙන්කරවා ගෙන යාපනය විශ්වවිද්‍යාලය වෙත යොමු කරන ලෙස ඉල්ලා සිටි අතර එමගින් විශ්වවිද්‍යාලයට ඉදිරි වැඩ කරගෙන යාමට සහ සම්පූර්ණ කිරීමට හැකි වන බව. මේ සම්බන්ධයෙන් විශ්වවිද්‍යාලයට උපකාර කිරීම සඳහා විශ්වවිද්‍යාලය විසින් දැනටමත් ඉල්ලීම් කර ඇති අතර අදාළ සියලු පාර්ශවයන් සමඟ මේ පිළිබඳව අවධානය යොමු කර ඇති බව. | ප්‍රමාදයන් වලක්වා ගැනීමට ක්‍රියාමාර්ග ගත යුතු අතර කොන්ත්‍රාත්තුවේ වැඩ නියමිත වේලාවට අවසන් කිරීමට පියවර ගත යුතුය. |

### 3.4 ඌන උපයෝජිත වත්කම්

| අංකය | විගණන නිරීක්ෂණය | කළමනාකරණයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශය |
|---|---|---|---|
| (අ) | මෙම ව්‍යාපෘතිය මගින් 2020 - 2022 කාලපරිච්ඡේදය තුළදී නැගෙනහිර විශ්වවිද්‍යාලයට ලබාදුන් රු. මිලියන 41ක් වටිනා අයිතම 20කට අදාළ ඒකක 557ක් මාස 04 සිට වසර 03 ක් දක්වා අදාළ අරමුණු සඳහා ප්‍රයෝජනයට ගෙන නොතිබුණි. | මෙම අයිතම ස්ථාපනය කිරීමට සහ භාවිතා කිරීමට නියමිත අදාළ සිවිල් වැඩ නිම නොකිරීම ප්‍රධාන වශයෙන්ම හේතු වූ බව. කොන්ත්‍රාත්කරුවන් සිවිල් වැඩ අවසන් කිරීමට බොහෝ කාලයක් ගත කරන ලදී. අවසාන වශයෙන්, සියලුම වැඩ නිම කර ඇති අතර ව්‍යාපෘතිය අවසන් වීමට පෙර සියලුම අයිතම ඒවායේ යෝජිත ස්ථානයන්හි ස්ථාපනය කරන ලද අතර දැන් සියල්ල භාවිත කරන බව. | ව්‍යාපෘති සම්පත් ප්‍රමාදයකින් තොරව ප්‍රයෝජනයට ගත යුතුය. |
| (ආ) | සිසුන්ගේ ප්‍රායෝගික කුසලතා වැඩිදියුණු කිරීම, බිම් මට්ටමේ සිට ගොවීන් සහ කුඩා / මධ්‍යම පරිමාණ කෘෂි ව්‍යාපාරිකයන් සමඟ ක්‍රියාකාරකම් සිදු කිරීම සහ සිසුන්ගේ සහ කාර්ය මණ්ඩලයේ ක්ෂේත්‍ර දැනුම වර්ධනය කිරීමේ අරමුණින්, මෙම ව්‍යාපෘතියේ ප්‍රතිපාදන මත රුපියල් මිලියන 14 ක මුදලක් වැය කර 2021 පෙබරවාරි 24 වන දින සබරගමුව විශ්වවිද්‍යාලය විසින් මිලදී ගන්නා ලද ජංගම රසායනාගාර බස් රථය. 2021 මාර්තු සිට 2023 දෙසැම්බර් දක්වා කාලය තුළ අවස්ථා 06කදී පමණක් අධ්‍යයන කටයුතු සඳහා යොදාගෙන ඇති අතර ඒ අනුව බස් රථය ඌන උපයෝජිතව පැවතුණි. | නොවැළැක්විය හැකි සහ අනපේක්ෂිත තත්වයක් හේතුවෙන් අන්තර්ජාලය හරහා ඉගැන්වීම් කටයුතු සිදු කරන ලද කාල පරිච්ඡේද තුළ සැලසුම් කළ පරිදි මෙම සම්පත් භාවිතා කිරීමට අපට නොහැකි වූ බව මම ඉස්මතු කර දැක්වීමට කැමැත්තෙමි. කෙසේ වෙතත් දැනට පවතින අනධ්‍යයන වෘත්තීය ක්‍රියාමාර්ගය ඉවත් කළ වහාම මෙම සම්පත් භාවිතා කරමින් ක්ෂේත්‍ර චාරිකා, නිරූපන සහ ප්‍රජා සංවර්ධන වැඩසටහන් කිහිපයක් අප සැලසුම් කර ඇති බව සතුටින් දන්වා සිටිමු. | ව්‍යාපෘති සම්පත් ප්‍රමාදයකින් තොරව ප්‍රයෝජනයට ගත යුතුය. |